# ජාතික අධ්‍යාපන ආයතනය

# විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022

# අයදුම්පත් කැඳවීම

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

දරුවන්ගේ දෘෂ්ටි ඌනතා, ශ්‍රවණ ඌනතා, කායික දුබලතා, බුද්ධිමය දුබලතා, ඔටිසම් තත්ත්වය හා වෙනත් ඉගෙනුම් දුෂ්කරතා නිසා මතුවන ඉගෙනීමේ ගැටලු ඇතුළත් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හඳුනාගෙන ඔවුන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කරනු ලබන අර්ධකාලීන පාඨමාලවක් වේ. අධ්‍යයන සැසි හා දේශන මාර්ගගත තාක්ෂණය (Zoom) ඔස්සේ හා ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි තෝරාගත් ආයතනවලදීත් පැවැත්වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලා සඳහා සකස් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF Sri lanka qualifications Framework) අනුව මෙම පාඨමාලාව සකස් කර ඇත.

**ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්**

2022.09.10 වන දිනට වයස අවුරුදු 55 ට අඩු අයෙකු වීම

අ. පො.සා. (උ. පෙළ) සමත් වීම

**සහ**

රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයෙකු වීම

**හෝ**

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක/ ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම

**හෝ**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ / ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු වීම

**හෝ**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු වීම හෝ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ පාලසක/ ආයතනයක සේවයේ යෙදී සිටින්නකු වීම.

**පාඨමාලාවට තෝරා ගැනීමට** – ලිඛිත පරීක්ෂණයක්/ සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් හෝ ඉන් එකක් මත සුදුස්සන් තෝරාගනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

| | **ගාස්තු** |
|---|---|
| ඉල්ලුම්පත් ගාස්තුව | 200.00 |
| ලියාපදිංචි ගාස්තුව | 1,000.00 |
| පාඨමාලා ගාස්තුව | 30,000.00 |

**අයදුම්කළ යුතු පිළිවෙළ**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත සඳහන් අයදුම්පත සම්පූර්ණ කර ඒ සමග මහරගම ලංකා බැංකුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 607628 දරන ගිණුමට බැරවන සේ රු. 200/= ක මුදලක් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් කුවිතාන්සිය සමග අධ්‍යක්ෂ, අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (මුදල් ඇණවුම් සමග එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2022**" යනුවෙන් සඳහන් කළ යුතුයි. පාඨමාලාව සඳහා ගෙවන ලද මුදල් කිසිදු හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2022.09.10

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**
2022.07.29

# ජාතික අධ්‍යාපන ආයතනය

# මහරගම

# විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - 2022

## ආදර්ශ අයදුම්පත්‍රය

01. සම්පූර්ණ නම : ..........
02. මුලකුරු සමග නම : ..........
03. ලිපිනය (පෞද්ගලික) : ..........
04. ලිපිනය (සේවය කරන පාසලේ / ආයතනයේ) : ..........
05. මාධ්‍යය : ..........
06. ජාතික හැඳුනුම්පත් අංකය : ..........
07. උපන් දිනය : ..........
08. 2022.09.10 දිනට වයස : ..........
09. වෘත්තීය : ..........
10. දුරකථන අංකය (ජංගම) : ..........
11. අධ්‍යාපන සුදුසුකම් : ..........

| **අපොස (උ/ පෙළ) වර්ෂය ..........** | | **අපොස (සා/ පෙළ) වර්ෂය ..........** | |
|---|---|---|---|
| **විෂය** | **ශ්‍රේණිය** | **විෂය** | **ශ්‍රේණිය** |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් (විශේෂ අධ්‍යාපනයට අදාළ) : ..........
13. වෙනත් සුදුසුකම් : ..........

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.**

..........

අයදුම්කරුගේ අත්සන

දිනය : ..........